- **<u>කෙටි පිළිතුරු සපයන්න.</u>**
  1. දෙවියන් වහන්සේ පස්වන දින මවන ලද්දේ මොනවාද? (පිටුව - 14)
  2. මාක් තුමාගේ ශුභාරංචියේ සංකේතය කුමක්ද? (පිටුව - 09)
  3. "මර්යාවෙනි බිය නොවන්න,ඔබ දෙවියන්ගෙන් වරප්‍රසාද ලද්දේහය."මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන්ද? (පිටුව - 26)
  4. ශුද්ධවූ බයිබලයේ ප්‍රධාන කොටස් ගණන කීයද? (පිටුව - 02)
  5. පංච පුස්තකයට අයත් පළමු පොත නම් කරන්න. (පිටුව - 05)
  6. දේව මැවිල්ලේ උතුම්ම මැවිල්ල කුමක්ද? (පිටුව - 21)
  7. ජේසුස් වහන්සේගේ උපත ගැන ප්‍රකාශ කල දිවැස්වරයා කවුද? (පිටුව - 26)
  8. ඊශ්‍රායෙල් ජනයා පොරොන්දු දේශය කරා ගෙන ගියේ කවුද?
  9. ශුභාරංචියක් ලියන ලද එකම අන්‍යජාතිකයා කවුද? (පිටුව - 10)
  10. මහළුවියේදී පුතකු පිළිසිඳගත් මරියතුමියගේ ඥාතිවරිය කවුද?

- **<u>හිස්තැන් පුරවන්න.</u>**
  1. නික්මයාම පොතෙහි ප්‍රධාන චරිතය _____ තුමාය. (පිටුව - 06)
  2. ශු. ජොහාන් තුමා _____ තුමාගේ සහෝදරයෙකි. (පිටුව - 02)
  3. දෙවියන් වහන්සේ තමන් මවා වදාළ සියළු දේ නරඹා එය ඉතා _____ _____බව දුටු සේක. (පිටුව - 23)
  4. දෙවියන් වහන්සේ සතුන් හා මිනිසා මවන ලද්දේ _____ දිනයේය. (පිටුව - 14)
  5. ජේසු කුමරුට අවුරුදු _____ ජෙරුසෙලමේ පඬිවරු මැද ප්‍රශ්න සඳහා පිළිතුරු දුන්සේක. (පිටුව - 33)

www.keou.lk

II කොටස

- **<u>පිළිතුරු සපයන්න.</u>**

1.

i. ශුභාරංචිය යනු කුමක්ද?
ii. සුවිශේෂක වරුන් සතරදෙනා හා ඔවුන්ගේ සංකේත නම් කරන්න.
iii. එක් ශුභාරංචි කතුවරයෙකු ගැන වාක්‍ය 3 ක් ලියන්න.

(පිටු 08 -11)

2.

i. මිනිසා අන් මැවිල්ලට වඩා උසස් වීමට හේතු 2ක් ලියන්න.
ii. මිනිසාට පැවරුණු වගකීම් 2 ක් ලියන්න.
iii. මැවිල්ල ආරක්ෂා කිරීමට කල හැකි කාර්යයන් 3 ක් ලියන්න.

(පිටු 19-23)

3.

i. ජේසුස් වහන්සේ ඉපදුණු ස්ථානය නම් කරන්න.
ii. ජේසුස් වහන්සේ වර්ධනය වූ ආකාරය කරුණු 2 කින් දක්වන්න.
iii. ළමා ජේසුගේ ජීවිතයෙන් ගත හැකි ආදර්ශ 3 ක් ලියන්න.

www.lkedu.lk